දුරකථන /தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832 Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50 Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாய'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } .....................

මගේ අංකය / எமது இல. / My No. } ED/1/9/1/1/2

දිනය / திகதி / Date } 2012.05. 08

චක්‍රලේඛ අංකය :2012/ 13

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පාසල් ප්‍රධානීන් වෙත

## <u>ප්‍රාථමික අධ්‍යාපන විෂය නිර්දේශ නිසි ලෙස ක්‍රියාත්මක කිරීම</u>

01 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ව ජාතික අධ්‍යාපන ආයතනය විසින් පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා හඳුන්වා දී ඇති විෂය නිර්දේශ, අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක නොවන අවස්ථා පවතින බව වාර්තා වී ඇත. හඳුන්වා දී ඇති එම විෂය නිර්දේශ අපේක්ෂිත මට්ටමින් ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය බව අවධාරණය කරනු පිණිස මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

02 පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා හඳුන්වා දී ඇති විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය වුවත් එසේ නොකර පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය ඉලක්ක කර ගනිමින් විවිධ බාහිර පොත්පත්, සඟරා සහ බාහිර ආයතනවලින් ලබා ගත් ප්‍රශ්න පත්‍ර වැනි දේ පාසල් වේලාව තුළ භාවිතයට සිසුන් යොමුකරන බව වාර්තා වී ඇත.

03 ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව 1995.04.28 දින නිකුත් කරන ලද අංක7/95 චක්‍රලේඛය මගින් පස්වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ පළමුවන ප්‍රශ්න පත්‍රයෙන් ශිෂ්‍යයන් සතු ඉගෙනුම් හැකියා හා විභව්‍යතා 14ක් මැනීමට ලක් කරන බවත් දෙවන ප්‍රශ්න පත්‍රයෙන් පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් පන්ති කාමරයේ ඉගැන්වෙන විෂය අන්තර්ගතය ආශ්‍රිත ව ශිෂ්‍යයා අත්පත් කරගන්නා දැනුම, කුසලතා හා ආකල්ප මැනීමට ලක් කරන බවත් සඳහන් කර ඇත. මේ අනුව ප්‍රාථමික අධ්‍යාපන අංශයට නියමිත විෂය නිර්දේශ විධිමත් ව ක්‍රියාත්මක කිරීම මගින් මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවශ්‍ය නිපුණතා සිසුන් තුළ වර්ධනය කිරීම සිදුකළ යුතුය.

04 එහෙත් ඇතැම් පාසල්වල පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය මුල් කර ගනිමින් විවිධ පුද්ගලයින් හා විවිධ සංවිධාන සමඟ වැඩමුළු හා සම්මන්ත්‍රණ ආදිය පාසල් කාලය තුළ පැවැත්වීමත් එම අවස්ථා උපයෝගී කර ගනිමින් සිසුන්ට හා දෙමව්පියන්ට විවිධ පොත් පත්, සංයුක්ත තැටි ආදිය අලෙවි කිරීමත් සමහර ගුරුවරුන් පාසල තුළ මුදල් අයකර ගනිමින් අමතර පන්ති පැවැත්වීම හා එම පන්තිවලට සහභාගී නොවන සිසුන්ට විවිධ බලපෑම් කිරීමත් වාර්තා වී ඇත. මෙය සිසුන්ට මහත් පීඩාකාරී තත්ත්වයක් මෙන්ම දෙමව්පියන්ට ද අමතර වියදමකි. මෙවැනි කටයුතු පාසල තුළ සිදු නොකළ යුතු බව අවධාරණය කරමි.

05 ප්‍රාථමික අධ්‍යාපන අංශය ප්‍රධාන අවධි තුනකට බෙදා ඇත. එක් ප්‍රධාන අවධියක් සඳහා එක් ගුරුවරයකු පත් කළ යුතු ය. එක් ප්‍රධාන අවධියක් අවසානයේ දී ඊළඟ ප්‍රධාන අවධිය සඳහා වෙනත් ගුරුවරයකු පත්කළ යුතු ය.

06 ප්‍රාථමික අධ්‍යාපන අංශයේ එක් එක් ශ්‍රේණිවල දී හා එක් එක් අවධිවල දී සිසුන් ළඟා විය යුතු නිපුණතා මට්ටම් හඳුන්වා දී ඇත. මෙම නිපුණතා මට්ටම් කරා සිසුන් ළඟා කරවීම අදාළ අවධි භාර ගුරුවරුන්ගේ වගකීම වේ. ඒ සඳහා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහවල දක්වා ඇති ආකාරයට තක්සේරුකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළ යුතු ය. සමහර විදුහල්වල එක් ප්‍රධාන අවධියක් අවසානයේ දී විවිධ හේතු පදනම් කර ගනිමින් සමාන්තර පන්ති අතර සිසුන් මිශ්‍ර කිරීම සිදු කරන බවට ද වාර්තා වී ඇත. එසේ නොකළ යුතු බව අවධාරණය කරමි.

07 පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දී ඇති විෂය නිර්දේශ,ගුරු මාර්ගෝපදේශ විධිමත් ව ක්‍රියාත්මක කළ යුතු අතර විෂය නිර්දේශවලට අනුකූලව ලබා දී ඇති පෙළපොත් භාවිත කිරීමට සිසුන් යොමු කරවමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ක්‍රියාත්මක කිරීම පාසල තුළ සිදු වන බවට විදුහල්පතිවරුන් වග බලාගත යුතු ය.

එච්.එම්.ගුණසේකර
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් 1. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
2.විභාග කොමසාරිස් ජනරාල් - විභාග දෙපාර්තමේන්තුව
3. සියලු ම පළාත් ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
4. සියලු ම කලාප ප්‍රාථමික අධ්‍යාපන සම්බන්ධීකරණ නියෝජ්‍ය /සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්